# MR 2 JR Project

රට පුරා හොල්මන් කරන අවතාරයක් මතු වෙලා තියෙනව. ඒ තමා විදේශ මැදිහත් වීම ගැන අවතාරය.

නාවික හමුදාව කියන විදියට මන්නාරම් මුහුදේදි ඔවුන්ට පහර දී නැවක් සමඟ නාවික භට පිරිසක් අතුරුදහන් කළේ මුහුදු කොටි නෙවෙයි. ඉන්දියානු බෝට්ටු භාරසියයක් මෙයට වගකිව යුතු බවයි කියන්නේ.

ඒ අතර විමල් වීරවංශ මර ළතෝනි දෙනව ආරක්ෂාව සඳහා වගකීම යටතේ (R2P) එක්සත් ජාතීන්ගේ හමුදා වඩම්මන්න කුමන්ත්‍රණයක් තියෙනව කියලා. ඒ ගැන රාධිකා කුමාරස්වාමිටත්, රාමා මානිටත් දොස් පවරල තිබුණා.

ආචාර්ය රාමා මානි කියල තිබුණ මේ රටේ ප්‍රබල සංවිධානාත්මක හමුදාවක් ඉන්න කොට මොකටද R2P ක්‍රියාත්මක කරන්නේ. ඒ වගන්තිය ක්‍රියාත්මක කරන්නේ රජයක හමුදාව බිඳ වැටුනොත්නෙ කියල.

ඒකෙන් තේරෙන්නේ කැරලිකාර හමුදා බලවත් වෙන කොට ගෝලීය බලවතුන් මැදිහත් වන බවයි. විමල් වීරවංශ හිතන්නේ ගෝලීය ධනවාදය විප්ලවවාදි හමුදාවලට උදව් වෙන්න රටවල්වලට කඩා පනිනව කියලයි.

ඒ අනුව වෙන්න ඕනෑ උන්නැහේ හයිටිවලට ලංකා හමුදා යැවීම ගැන මහ ලොකු උනන්දුවකින් කථා කළේ. අබුද්දස්සෙට ලබුත් තිත්තයි කියල කියමනක් තියෙනව.

දැන් විමල්ගේ මාක්ස්වාදයට අනුව අධිරාජ්‍යවාදය, විප්ලවයට අත දෙමින් කටයුතු කරනව. ඒත් රාමා මානි මැතිනිය ඇත්ත හෙළදරව් කළා.

ඒ අතර කොටි දේශපාලනය නායක නඩේසන් ඉල්ලීමක් කරල තිබුණා එක්සත් ජාතීන්ගේ සංවිධානයට තම ජාතියේ ස්වාධිපත්‍යය පිළිගන්න කියල.

අනෙක් අතට ඉංදියාව, ඇමරිකාව ත්‍රස්තවාදය මැඩලීමට උපදෙස් දෙන අතර බලය බෙදාහැරීම ගැනත් තදින් කථා කරනව.

ඇත්තම කියනව නම් මහින්දට 13 වන ව්‍යවස්ථා සංශෝධනයත්, ඉංදු-ලංකා ගිවිසුමත් මතක් උනේ උන්දලගෙත් කණේ පාර වැදුනට පස්සේ.

දැන් ඉංදියන් හමුදාව වෙනුවෙන් රන් පිළිම හදන්නටත් මහින්ද කථා කරනව. මේ අනුව බලන කොට දෙමළ ජනතාවගේ ප්‍රශ්නය දඩමීමා කරගෙන විදේශ බලපෑම් වැඩි වෙලා බව ඇත්ත.

R2P හමුදාවක් එනව නම් එන්නේ බලය බෙදාහැරීම ආරක්ෂා කිරීමත් ඉස්සරහට දාල, ඒකට එන දකුණේ විරුද්ධත්වය මැඩපැවැත්වීමත් සමඟ කොටි සංවිධානය දඬුකඳේ ගැසීම අරමුණු කරගෙන.

එහෙම කරල මහින්දව තවත් ජේ.ආර්. ජයවර්ධන කෙනෙක් බවට බව්තීස්ම කරන්න බලාගෙන.

කොටින්ම MR2JR Project කියල කිව්වට නැත්නම් M2J ව්‍යාපෘතිය කිව්වට කමක් නෑ.

එතකොට විමල් වීරවංශලට වෙන්නේ අන්තිමේදි "UN වඳුරු හමුදා පන්නපියව්" කියල කොටි සංවිධානය සමඟ පාරට බහින්නයි.

වමේ ව්‍යාපාරයට ලොකු වගකීමක් අද තියෙනව විමල් වීරවංශලාගේ මේ පිස්සු කෙළීමට විරුද්ධව රටේ නිදහසත්, සිංහල, දෙමළ නිදහස් සමාජයක් වෙනුවෙන් පෙරට එන්න.

ඇත්තටම දෙමළ ජාතික ප්‍රශ්නය අපිම විසඳා ගන්නේ නැතිව ජාතිවාදය ඇවිස්සීම තුළින් විදේශ බලවේගවලට ඇතුල්වීමට ඉඩ දෙන එකයි විමල්ලා කළේ.

අද මේ ගෝලීය බලවතුන් ඇතුල්වීමට දරන ප්‍රයත්නයට විරුද්ධව ලෝක වාමාංශික බලවේගවලට ආරාධනා කරන්නට වම පෙරට ආ යුතු වෙලාවක්.

ඒක කරන්න නම් දෙමළ ජාතික ගැටළුවට ලෙනින්වාදී බලය බෙදාහරීමේ විසඳුමක් ඉදිරිපත් කරන්නට වෙනව.

විමල්ලාගේ ජාතිවාදී නඩයට නම් ඒ ගැන හිතන්නවත් බෑ. මොකද, ලෝකය පුරාම වමේ සංවිධානත් දැන් හොඳට විමල්ලගේ දේශප්‍රේමී විගඩම ගැන අවබෝධ කරගෙනයි ඉන්නේ.

ඒ නිසා වමේ බලවේගවලින් ලෝකයා ඇමතීමක් කරන්නට වෙනව. විශේෂයෙන් කියුබාව, වෙනිසියුලාව, බොලිවියාව වගේ වාමාංශික ආණ්ඩු තියෙන රටවල රාජ්‍ය නායකයින්ට මැදිහත් වෙන ලෙසට ඉල්ලීමක් කරන්න පුළුවන්.

ඒ අයව රටේ තත්වය ගැන දැනුවත් කරන්නට පුළුවන්. අනෙක් අතට බලවත් වාමාංශික පක්ෂවල නායකයින්ටත් ආරාධනා කළ යුතු වෙනව. විශේෂයෙන් ඉංදියාවේ වාමාංශික පක්ෂ මේ ගැන දැනුවත් කළ යුතුයි.

දැනටමත් ඉංදියානු කොමියුනිස්ට් පක්ෂය හා මාක්ස්වාදී කොමියුනිස්ට් පක්ෂය ලංකාවේ ෆෙඩරල්වාදී විසඳුමක් ගැන කථා කරල තියෙනව. අනෙක් අතට ප්‍රාන්තවල සමාජවාදී පක්ෂවලටත් මේ ගැන අපි කථා කළ යුතු වෙනව.

මේ ඇරුණු කොට ප්‍රගතිශීලී විවිධ බුද්ධමතුන් ලෝකය තුළ ප්‍රබල මැදිහත් වීම් කරනව. සුසන් ජෝර්ජ්, අරුන්ධතී රෝයි, ජෝන් පිල්ගර් වැනි රැඩිකල් බුද්ධිමතුන්ගෙන් අපට මේ විදේශ කඩා පැනීම් ගැන මැදිහත්වීමක් බලාපොරොත්තු වෙන්න පුළුවන්.

නෝම් චොම්ස්කි වැනි අයත් මැදපෙරදිග ඇමරිකන් මැදිහත් වීමට විරුද්ධව හොඳ බලපෑමක් එල්ල කරල තියෙනව. මේ විදියට බැළුවහම වමට උදව් කරගන්න ලොකු බලවේගයක් තියෙනව.

මේ වන විට පලස්තීන ප්‍රශ්නය වෙනුවෙන් මේ වගේ වමේ බලවේගවලට උදව් ගන්නා ලෝකේ පුරා පැතිරුණු උද්ඝෝෂණ සංවිධානය වෙලා තියෙනව.

විශේෂයෙන් ප්‍රධාන ධනපති රටවලම වමේ උදවියගෙ සහය ඇතිව බලපෑමක් ඇති කිරීම තුළින් මේ රට තුළ වමට උවමනා විසඳුම දෙසට අපට ගමන් කරන්නට පුළුවන් වේවි.

එහෙම නොකළොත් මේ රට තුළට R2P නෙවෙයි කෙළින්ම ඉංදියා- ඇමරිකා හමුදා ඇතුල්වීමට ඉඩකඩ මතු වේවි.

එදාට විමල් වීරවංශලාට කරන්න පුළුවන් ඉටි ගෙඩියක් නෑ, තමන් හදපු වළේ තමන්ම බිළි වෙනව හැරෙන්නට.